

# මැජික් පින්සල

කවිත්මි දුලන්යා යාපා
4 ශ්‍රේණිය
මියුසියස් විද්‍යාලය, කොළඹ 07
පොත ප්‍රකාශිත දිනය: 2025 පෙබරවාරි 08

ISBN : 978-624-208-168-7

## පිදුම

**මට හීන දකින්න සිහිනයක් සැදූ අම්මාට,**
**මට ශක්තියක් වූ තාත්තාට,**
**සෑම වේලාවකම ආදරෙන් මා වටහාගත් ආත්තෝට**
**උතුම් ආදරයෙන් පුදන්නෙමි.**

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනේන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුලින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

**විදුහල්පතිනිය**
**ශෂිකලා සේනාධීර**
**මහමායා බාලිකා විද්‍යාලය- මහනුවර**

# මැජික් පින්සල

ඈත ගමක කඳු පාමුල
පිහිටි ලස්සන ගම්මානෙක
හිටියා එක පුංචි ළමයෙක්
චිත්‍ර අඳින්නට ආසැති

එයාගේ නම දූලාන්යාලු
පුංචි ඇසුත් නිල් පාටලු
කළු කොන්ඩය දිගට දිගේ
කඩා හැලෙයි ඇල්ල වගේ



එදා හරිම වැස්සක්ලු
එළියේ සෙල්ලම් බැලු
ගෙදර ඇතුලෙ අට්ටාලෙට
හොරෙන් ගියාලු

අට්ටාලය මුල්ලට වී
දූවිල්ලෙන් මකුළු දැලින්
වට වුණු හැඩ පෙට්ටගමක
ඇස ගැටුණාලු



වට පිට හෙම හොරෙන් බලා

ඇඟිලි තුඩු වලින් ඇවිදින්

හෙමින් හෙමින් පෙට්ටගමේ
ළඟට ගියාලු

අසළ තිබූ බංකුව ගෙන
ඒක උසට නැඟ හනිකට
පෙට්ටගමේ බරැති පියන
ඇරගත්තාලු



මහ විශාල පෙට්ටගමේ
ඇතුළට එබිලා හනිකට
ඇති දේවල් එහෙට මෙහෙට
කර බැලුවාලු

මේක හොඳයි මට
චිත්‍ර අඳින්නට
පැනලා හනිකට
ගත්තලු පින්සල



පාට පෙට්ටියත් අරගෙන
චිත්‍ර පොතේ පිටුවක් ගෙන
අලුත් පින්සලෙන් හනිකට
චිත්‍ර අඳින්නට වුනා

තැඹිලි පාට බුල් පූසා
ඇන්ද ගමන් කොලයක් උඩ
ඤාව් ගාලා හනි හනිකට
කොළයෙන් එපිටට පැන්නලු



ඉන්පසු ඇඳි බලු පැටවා
බව්  බව් ගා වලිගේ වනා
පූස් පැටියා පසු පස්සෙන්
දුවලා ගියාලු



අරුම පුදුම පින්සලක්ය

මේක මැජික් පින්සලක්ය

අඳින අඳින දේවල් හට

පණ එනවාලු

පින්සල ගෙන පරිස්සමට

පෙට්ටගමේ ඇතුලට කර

හොරෙන් හොරෙන් තිබුණ තැනම

තියන්නට වුණා

මේ අයුරින් ටික දවසක්

ගෙවෙන්නට වුණා

පුංචි දූලා හැමදාමත්

පින්සල ගෙන බලන්නට වුණා

ඔය අතරෙදි වැස්සක් නැති

අව්වත් වැඩි නියං කලක්

පුංචි දූලාගේ ගම වෙත

එබෙන්නට වුණා

වගාව හරි අමාරුයිලු

ඇළ පාරත් සිඳිලා ගිහින්

තාත්තා හැම දින හවසම

කියන්නට වුණා



මේක අහපු පුංචි දූලා

හරිම දුකින් සිතා බලා

එක පාරට පෙට්ටගමට

දුවලා ගියාලු

මහ රෑ මැද පින්සල ගෙන
කවුරුත් නිදි ඒ යාමෙට
මිදුලට පැන ගහටත් නැඟ
මහ ලොකු කළු වලාකුලක් අහසේ ඇන්දලු

දුවලා ගිහින් ඇල අද්දර
ගලින් ගලට ගලා දුවන
සැඩ ජල පහරක්
ඇඳන් ගියාලු




හනි හනිකට ආපස්සට
දුවගෙන විත් පෙට්ටගමට
හැමදා වගේ ඒ පින්සල
හංගා දැමුවලු

මහ රෑ මැද අකුණු ගසා
මහා වැස්සක් ඇද හැලීලා
පුංචි ඇලේ වතුර පහර
සැඩ වූවාලු



වේලී ගිය කුඹුරුයාය
වැස්ස නිසා යස අගේට
හිනාවෙවී ඇස් ඇරගෙන
බලා හිටියලු

මේ බව අදහා ගන්නට
බැරුව උන්නු ගමේම අය
හරි සතුටින් සිය වගාව
පටන් ගත්තලු



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට  දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුල විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනග දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහලේකම්

**ISBN: 978-624-208-168-7**